# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1973/6 - 2016 ජුනි මස 27 වැනි සඳුදා - 2016.06.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යවරයාට විෂයයන් හා කාර්යයන් පැවරීම 2016 ජුනි මස 09 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති,
ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍ය.

2016 ජුනි මස 20 වැනි දින.

**උපලේඛනය**

**ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු පනත්* |
|---|---|---|
| 1. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය සඳහා සහ සාමය ගොඩනැංවීම සඳහා කටයුතු කෙරෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සහයෝගීත්වයෙන් ක්‍රියා කරමින් අන්තර් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගැටලු ඇතොත් ඒවා සමනය කිරීම | | |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

**ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු,*<br>*ව්‍යවස්ථාපිත*<br>*ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු*<br>*පනත්* |
|---|---|---|
| 2. ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධානය පිළිබඳව දැනට ක්‍රියාත්මක කෙරෙන සහ යථා කාලයේදී ක්‍රියාත්මක කිරීමට නියමිත විවිධ උපාය මාර්ග සමාලෝචනය සහ ගැටලු නිරාකරණයට මැදිහත් වීම | | |
| 3. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පරීක්ෂණ කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය වූ විට මැදිහත් වීම | | |

07-566

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.